*සැ. යු.*- 2021.06.25 දින පළ වූ අංක 2,234 දරන *ගැසට් පත්‍රයෙහි* I:III, II, III සහ IV(අ) කොටස් පළ නොවිය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,235 - 2021 ජූලි මස 02 වැනි සිකුරාදා - 2021.07.02

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## II කොටස – අධිකරණ

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙන පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| සම්මත වූ පනත් ... ... ... ... | — |
| පනත් කෙටුම්පත් ... ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ දැන්වීම් ... ... ... ... | — |
| ශ්‍රී ලංකා ඇපැල් උසාවියේ දැන්වීම් ... ... ... | — |
| ශ්‍රේෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන ... | — |
| දිසා අධිකරණ හා මහෙස්ත්‍රාත් අධිකරණ දැන්වීම් ... | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| පිස්කල් මාර්ෂල්වරුන්ගේ පත් කිරීම් ... ... ... | — |
| පිස්කල් විකිණීම ... ... ... | 420 |
| බූදල් නඩු පිළිබඳ දැන්වීම් ... ... ... ... | — |
| නීති අධ්‍යාපන සභාවේ දැන්වීම් ... ... ... | — |
| නොතාරිස් ලැයිස්තු ... ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළකරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාලවේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2021 ජූලි මස 22 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2021 ජූලි 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

**"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් *ගැසට් පත්‍රයේ* පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන *ගැසට් පත්‍රයක* පළ කරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැළකිය යුතු ය."**

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

මෙම *ගැසට් පත්‍රය www.documents.gov.lk* වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

# පිස්කල් විකිණීම්

## ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමයි

(කොළඹ පැවැත්වෙන) බස්නාහිර පළාතේ පළාත්බද වාණිජ මහාධිකරණයේ දී ය

කොළඹ 10, ටී. බී. ජයා මාවතේ, අංක 479 (කලින් අංක 481) දරන ස්ථානයේ ලියාපදිංචි කාර්යාලය සහ නුගේගොඩ, හයිලෙවල් පාර, අංක 181 දරන ස්ථානයේ ශාඛා කාර්යාලයක් පවත්වාගෙන යන, හැටන් නැෂනල් බෑන්ක් පීඑල්සී.
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

*නඩු අංකය* : සී.එච්.සී. 49/2012/එම්.ආර්.
*ස්වභාවය* : උකස්
*කාර්ය පටිපාටිය* : සාමාන්‍ය
*වටිනාකම* : රු. මිලියන 06යි

...................*පැමිණිලිකරු.*

*එදිරිව*

දයා හේවා පතිරණ,
අංක 29/12, ප්‍රගති මාවත, හෝමාගම.
*නව ලිපිනය :*
රෝහල හංදිය, හයිලෙවල් පාර, හෝමාගම.

......................*විත්තිකරු.*

ඉහත අංක දරන නඩුවේ වර්ෂ 2018 ක් වූ පෙබරවාරි මස 09 වැනි දින බස්නාහිර පළාතේ පළාත්බද (වාණිජ) මහාධිකරණයේ නඩු තීන්දුවකින් ඉහත කී විත්තිකරුගෙන් අය කරගන්නට කියා පැමිණිලිකාර බැංකුවට නියම කරන ලද රු. 1,005,384.89ක මුදල (ගෙවන ලද මුදල අඩු කිරීමෙන් පසු) සහ එකී මුදල මත 2011 ජූලි මස 27 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් ඒ වසරකට 22%බැගින් වූ වැඩිදුර පොළියක් ද, රු. 1,109,700.50 ක මුදල (ගෙවන ලද මුදල අඩු කිරීමෙන් පසු) සහ එකී මුදල මත 2011 ජූලි මස 27 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් ඒ වසරකට 22%බැගින් වූ වැඩිදුර පොළියක් ද, රු. 991,358.20ක මුදල (ගෙවන ලද මුදල අඩු කිරීමෙන් පසු) සහ එකී මුදල මත 2011 ජූලි මස 27 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් ඒ වසරකට 24%බැගින් වූ වැඩිදුර පොළියක් ද, සහ රු. 2,358,513.56 ක මුදල (ගෙවන ලද මුදල අඩු කිරීමෙන් පසු) සහ එකී මුදල මත 2011 ජූලි මස 27 වැනි දින සිට සම්පූර්ණයෙන් ගෙවා නිමකරන තෙක් ඒ වසරකට 25%බැගින් වූ වැඩිදුර පොළියක් ද, අයකර ගැනීම පිණිස එකී විත්තිකරුට විරුද්ධව ඇතුළත් කරන ලද නෛසයි තීන්දු ප්‍රකාශය අනුව නඩු ගාස්තු ද, අයකර ගැනීම සඳහා ආඥකොට තීන්දු ප්‍රකාශ කර ඇත.

තව ද, එකී විත්තිකරු විසින් එකී මුදල් නිසි පරිදි ගෙවීම පැහැර හැර ඇති බැවින්, එකී නඩුවෙන් නිකුත් කර ඇති විකිණීමේ බලය පිට නිසි ලෙස තහනමට ගෙන ඇති, මෙහි පහත උපලේඛනයේ දක්වෙන එකී විත්තිකරුට අයත් නිශ්චල දේපළෙහි හිමිකම්, අයිතිවාසිකම් හා ඊට අදාළ සෑම සියළු දේ,

වර්ෂ 2021ක් වූ ජූලි මස 13 වැනි දින පෙරවරු 11.00ට එකී දේපළ පිහිටි ස්ථානයේ දී මවිසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

### ඉහත කී උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියණෑ කෝරලේ, අධිකාරි පත්තුවේ, මහර ප්‍රාදේශීය සභා සීමාව තුළ සූරියපාළුව ගමෙහි පිහිටි ''මීගහවත්ත'' නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු පී. එම්. ලීලාරත්න විසින් මැන සාදන ලද අංක 09ජ්/2003 සහ 2006 පෙබරවාරි මස 08 වැනි දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කරන ලද ලොට් ඒ ලෙස ලකුණු කර ඇති ඉඩමට මායිම් කොටස වන ඊසාන දිශාවට : මීගහවත්ත බටඅත්තේදෙනිය ද, ගිණිකොණ දිශාවට : එස්. ඒ. එච්. පී. සමරකෝන් හිමිකම් කියන ඉඩමෙන් ද, නිරිත දිශාවට : කුසුමා රණතුංග සහ සුනිල් විජේසිංහ හිමිකම් කියන ඉඩමෙන් ද, සහ වයඹ දිශාවට : එම ඉඩමේ නොබෙදූ කොටසකින් ද, පාරෙන් ද සහ කඩවත සී. ටී. බී. ඩිපෝ සමාගමට අයත් ඉඩමෙන් ද මායිම් වූ අංක 09ජ්/2003 දරන පිඹුර ප්‍රකාර රූඩ් දෙකයි පර්චස් දෙක (අ. 0, රූ. 2, පර්. 2)ක විශාල ඉඩම ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ සී 660/294 ශීර්ෂය යටතේ ලියා පදිංචි කර ඇත.

*දේපළ පිහිටීම.-* මෙම දේපළ පෑලියගොඩ නගරයේ සිට මහනුවර දක්වා දිවෙන නුවර පාරේ කැලණිය, කිරිබත්ගොඩ නගර පසුකර කඩවත හන්දියට පැමිණ එතැනින් වමට වැටී ඇති ගනේමුල්ල පාරේ 3 වන කිලෝමීටර් කණුව අසලින් වැටී ඇති බටුහේන පාරේ මීටර් 300ක් පමණ ගමන් කළ විට වම්පසට වැටී ඇති අඩි 15ක් පළල පාර අවසානයේ මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසන් වූ වහාම සාර්ථක ගැණුම්කරු විසින්, (i) ගැණුම් මිලෙන් 25%ක් ද, (ii) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අංක 258 වගන්තිය ප්‍රකාරව පිස්කල්ගේ ගාස්තු ද, (iii) විකුණුම සඳහා වන සියලුම වියදම් ද මුදලින් ගෙවිය යුතුය. තව ද, ගැණුම් මිලෙන් ඉතිරි 75%ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත එකී නඩුවේ බැරට අධිකරණයේ තැන්පත් කළ යුතු ය.

ආර්. කේ. ගාමිණී වීරසිරි (සා. වි.),
අධිකරණ රෙජිස්ට්‍රාර්, නියෝජ්‍ය පිස්කල්,
වාණිජ මහාධිකරණය,
කොළඹ 12.

වර්ෂ 2021ක් වූ මැයි මස 07 වැනි දින දී ය.

07-115

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
## දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරනු ලබන
## සංශෝධිත ගාස්තු

2013 ජනවාරි මස 01 වැනි දින සිට

(සෑම සිකුරාදා දිනයන්හි ගැසට් පත්‍රය පළ කරනු ලැබේ.)

1. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් පළ කරනු ලබන්නේ ප්‍රසිද්ධ කරන්නාගේ වගකීම පිටය.
2. පෞද්ගලික පළකරන්නන්ගේ සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන ඒ සඳහා නියමිත සම්පූර්ණ ගාස්තුවත් සමග කොළඹ 08, බොරැල්ල, ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණාලයාධිපතිට තැපෑලෙන් එවීමට හෝ ගෙනැවිත් භාරදීමට පුළුවන.
3. කාර්යාල වේලාවන් පෙරවරු 8.30 සිට පස්වරු 4.15 දක්වා වේ.
4. මුදල් ගනුදෙනු කරනු ලබන්නේ පෙරවරු 9.00 සිට පස්වරු 3.00 දක්වා බව සැලකිය යුතු යි.
5. සියලු ම දැන්වීම් සහ ප්‍රකාශන සඳහා ගාස්තුව කලින් ගෙවිය යුතුයි. දැන්වීම් සහ ප්‍රකාශනයන් තැපෑලෙන් එවන විට ඒ සමග ම අයවිය යුතු ගාස්තුව සඳහා මුදල් ඇනවුමක් හෝ චෙක් පතක් හෝ තැපැල් ඇනවුමක් රජයේ මුද්‍රණාලයාධිපතිට එවිය යුතු ය. මුදල් ඇණවුම් ගෙවන කාර්යාලය බොරැල්ල තැපැල් කාර්යාලය වේ.
6. ප්‍රමාදය සහ දොස් වළක්වා ගැනීම සඳහා පළ කරන්නට නියමිත පිටපත කඩදාසියේ එක් පැත්තක පමණක් පැහැදිලි ව ටයිප් කර එවිය යුතු ය. **අත් අකුරින් ලියූ කිසිම නිවේදනයක් භාරගනු නොලැබේ.**
7. සෑම අත්සනකට ම යටින් අකුරු වෙන්කොට පැහැදිලිව අත්සනේ අකුරු ලිවිය යුතු යි.
8. වෙළෙඳ ප්‍රචාරක කටයුතු සඳහා දැන්වීම් හා රජයේ සේවයේ නොවන අයගේ නම් වෙනස් කිරීම පිළිබඳ කරන දැන්වීම් පළ කරනු නොලැබේ.
9. උසාවියේ අණපනත් යටතේ නිකුත් කළා යැයි හැඟෙන ප්‍රකාශන, සුප්‍රිම් උසාවියේ නීතිඥවරයකුගේ අනුමැතිය හෝ අත්සන නොමැතිව ප්‍රසිද්ධ කරනු නොලැබේ.
10. **2013 ජනවාරි මස 01 වැනි දින සිට දැන්වීම් සහ ප්‍රකාශනයන් සඳහා අය කරන ගාස්තු මෙසේ යි :-**

| | රු. | ශ. |
|---|---|---|
| අඟලකට හෝ ඉන් අඩුව ... ... ... ... | 137 | 0 |
| වැඩිවන සෑම අඟලකට හෝ ඉන් කොටසකට ... ... ... | 137 | 0 |
| තනි තීරුවකට හෝ *ගැසට්* පිටුවකින් අඩකට ... ... ... | 1,300 | 0 |
| තීරු දෙකකට හෝ සම්පූර්ණ *ගැසට්* පිටුවකට ... ... ... | 2,600 | 0 |

*(අඟලේ සෑම කොටසකට ම සම්පූර්ණ අඟලකට අය කරනු ලබන ගාස්තුව අය කරනු ලැබේ.)*

11. සෑම සිකුරාදා දිනකට ම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ප්‍රසිද්ධ නිවාඩු දින අතරට පැමිණෙන සෑම සතියක දී ම පළ කරන දිනය වෙනස් වීමට ඉඩ තිබේ.
12. සෑම මාසයක ම මුල් සතියේ *ගැසට් පත්‍රයේ* සෑම කොටසක ම කෙලවරෙහි වෙනම පළවන දැන්වීමේ සඳහන් ප්‍රකාර, සියලු ම දැන්වීම් සහ ප්‍රකාශනයන් කොළඹ 08, රජයේ මුද්‍රණාලයේ මුද්‍රණාලයාධිපතිට ලැබෙන සේ එවිය යුතු යි.
13. *ගැසට් පත්‍රය* නොලැබීම, ප්‍රමාද වී ලැබීම සහ ලිපිනය වෙනස් කිරීම් ආදිය කොළඹ 08, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ, මුද්‍රණාලයාධිපතිට දැනුම් දිය යුතු ය.
14. **2013 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මකවන සංශෝධිත දායක ගාස්තුව :-**

### ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය - (වාර්ෂික දායක මුදල සහ තැපැල් ගාස්තුව)

| | *වාර්ෂික දායක මුදල* | *තැපැල් ගාස්තුව* |
|---|---|---|
| | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි කොටස : | | |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 4,160 0 | 9,340 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 580 0 | 950 0 |
| III වැනි ඡේදය (වෙළඳ ලකුණු හා පේටන්ට් බලපත්‍ර ආදිය ) ... ... | 405 0 | 750 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව ) ... ... | 890 0 | 2,500 0 |
| II වැනි කොටස (අධිකරණ) ... ... ... ... ... ... ... ... | 860 0 | 450 0 |
| III වැනි කොටස (ඉඩම්) ... ... ... ... ... ... ... ... | 260 0 | 275 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... | 2,080 0 | 4,360 0 |
| V වැනි කොටස (මඟීන් ගෙන යෑමේ අවසර සහ පොත් නාමාවලිය) | 1,300 0 | 3,640 0 |
| VI වැනි කොටස (ජූරිසභිකයින්ගේ හා උපදේශකවරුන්ගේ නාමාවලිය)... ... | 780 0 | 1,250 0 |
| අති විශෙෂ ගැසට් පත්‍රය ... ... ... ... ... ... ...... | 5,145 0 | 5,520 0 |

(ලිත් වර්ෂය අවසානයේ නිමවන සේ දායක ගාස්තු භාරගනුයේ දොලොස් මාසයකට නොඅඩු කාලසීමාවකට පමණ ය. )

### * තනි පිටපත් සඳහා ගාස්තු (පිටපත් විකිණීමට තිබේ නම්)

| | **පිටපතක මිල** | **තැපැල් ගාස්තුව** |
|---|---|---|
| I වැනි කොටස : | *රු. ශ.* | *රු. ශ.* |
| I වැනි ඡේදය ... ... ... ... ... ... ... | 40 0 | 60 0 |
| II වැනි ඡේදය (පළ කිරීම්, ඇබෑර්තු, ටෙන්ඩර් සහ විභාග ආදිය) ... ... | 25 0 | 60 0 |
| III වැනි ඡේදය ... ... ... ... ... ... ... | 15 0 | 60 0 |
| I වැනි කොටස සම්පූර්ණයෙන් (I, II සහ III ඡේද තුන ම ඇතුළත් ව) ... ... | 80 0 | 120 0 |
| II වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| III වැනි කොටස ... ... ... ... ... ... ... ... | 12 0 | 60 0 |
| IV වැනි කොටස (පළාත් පාලන දැන්වීම් සහ පළාත් සභා දැන්වීම්) ... ... ... | 23 0 | 60 0 |
| V වැනි කොටස ... ... ... ... ... ... ... ... | 123 0 | 60 0 |
| VI වැනි කොටස ... ... ... ... ... ... ... ... | 87 0 | 60 0 |

* කොළඹ 05, පොල්හේන්ගොඩ, කිරුළපන මාවතේ, අංක 163 හි පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් තනි පිටපත් මිල දී ගත හැක.

# ගැසට් පත්‍රය පළ කිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රය* සාමාන්‍යයෙන් සිකුරාදා දිනවල පළ කරනු ලැබේ. සිකුරාදා දිනයක් රජයේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාදා දිනට ප්‍රථම වැඩ කරන දිනයේ *ගැසට් පත්‍රය* පළ කරනු ලැබේ. ඒ අනුව *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා නිවේදන භාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ *ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය සහ වේලාවන් පහත පළ කර ඇති උපලේඛනයේ දැක්වේ. පහත සඳහන් නියමිත වේලාවට පසු ලැබෙන සියලුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ *ගැසට් පත්‍රයේ* එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් වුවමනා *ගැසට් පත්‍රයට* දැන්වීම ඇතුළත් වෙනවා මෙන් ම එය සියලු දෙනාගේ ම පහසුවට ද හේතු වන බව සළකන්න.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය මිල දී ගැනීම සඳහා සියලුම දායක මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත කෙළින් ම ගෙවිය යුතුය.**

**සැළකිය යුතුයි.** - මුදල් ගෙවා *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දැන්වීම් සඳහා අයවිය යුතු මුදල් රජයේ මුද්‍රණාලයාධිපති වෙත එවිය යුතු බව සළකන්න.

## උපලේඛනය

### 2021 වර්ෂය

| *මාසය* | *පළ කිරීමේ දිනය* | | *ගැසට් පත්‍රයේ පළ කිරීම සඳහා දැන්වීම් භාර ගන්නා අන්තිම දිනය හා වේලාව* | | | |
|---|---|---|---|---|---|---|
| **ජූලි** | 2021.07.02 | සිකුරාදා | 2021.06.18 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.09 | සිකුරාදා | 2021.06.25 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.16 | සිකුරාදා | 2021.07.02 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.22 | බ්‍රහස්පතින්දා | 2021.07.09 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.07.30 | සිකුරාදා | 2021.07.16 | සිකුරාදා | දහවල් | 12.00 |
| **අගෝස්තු** | 2021.08.06 | සිකුරාදා | 2021.07.22 | බ්‍රහස්පතින්දා | දහවල් | 12.00 |
| | 2021.08.13 | සිකුරාදා | 2021.07.30 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.08.20 | සිකුරාදා | 2021.08.06 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.08.27 | සිකුරාදා | 2021.08.13 | සිකුරාදා | දහවල් | 12.00 |
| **සැප්තැම්බර්** | 2021.09.03 | සිකුරාදා | 2021.08.20 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.10 | සිකුරාදා | 2021.08.27 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.17 | සිකුරාදා | 2021.09.03 | සිකුරාදා | දහවල් | 12.00 |
| | 2021.09.24 | සිකුරාදා | 2021.09.10 | සිකුරාදා | දහවල් | 12.00 |

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2021 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.